# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,480 — 1965 අගෝස්තු 13 වැනි සිකුරාද — 1965.8.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (III) වැනි ඡේදය–වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 117 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරාද හැර සෑම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාද දිනවල දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාද දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥා පනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත නොව භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### " ඒ " කොටසේ හෝ " බී " කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ " ඒ " කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිවම කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ " බී " කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් " බී " අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැළසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළිගෙල කිරීමේ වියදම් දැරීමට පෙර, සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේ දී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීමද සැළකිල්ලට ගනු ලැබේ.

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි